# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1273 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 04/08/2024
පැය 0830

## මාධ්‍ය නිවේදනය

### 01. වෙඩි තබා පුද්ගලයෙකුට තුවාල සිදුකිරීමක් - සෙවනගල පොලිස් වසම.

2024.08.04 වන අද දින අළුයම් කාලයේ සෙවනගල පොලිස් වසමේ කිරිවැව ප්‍රදේශයේ නිවසක කාමරයක් තුළ නිදාගෙන සිටි පුද්ගලයෙකුට යතුරුපැදියකින් පැමිණි පුද්ගලයෙකු වෙඩි තබා පලාගොස් ඇති බවට ලද පණිවිඩයක් මත සෙවනගල පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 37 ක් වන කිරිඉබ්බන්ආර, සෙවනගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තුවාලකරු තම බිරිඳගේ නිවසේ නිදාගෙන සිටියදී මෙම වෙඩි තැබීමට ලක්ව ඇති අතර ඇඹිලිපිටිය රෝහලට ප්‍රතිකාර සඳහා ඇතුලත් කර ඇත. වෙඩි තැබීමට හේතුව හා වෙඩි තැබීමට යොදාගත් ගිනි අවියද මෙතෙක් අනාවරණය වී නොමැත. සෙවනගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. කේරළ ගංජා සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - ජයපුරම් පොලිස් ස්ථානය.

2024.08.03 වන දින දහවල් කාලයේදී ජයපුරම් පොලිස් වසමේ වලෙප්පාඩු එරුමතිව් මුහුදු තීරයේදී ජයපුරම් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **කේරළ ගංජා කිලෝග්‍රෑම් 176 ග්‍රෑම් 350 ක් සන්තකයේ තබාගනිමින් බෝට්ටුවක් මගින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25, 32 හා 36 වයස්වල පසු වූ වේරවිල් හා කත්තාලම්පිට්ටි ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ජයපුරම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**